## අනගාරික ධර්මපාලතුමා සහ ජාතික ව්‍යාපාරය

**මහාචාර්ය එම්. යූ. ඩී. සිල්වා**
රුහුණු විශ්වවිද්‍යාලය

අනගාරික ධර්මපාල නමින් අප හඳුන්වන ඩේවිඩ් හේවාවිතාරණ නම් ළදරුවා උපත ලැබුවේ 1864 සැප්තැම්බර් 17 දීය. ශ්‍රී ලංකාවේ  එවකට බ්‍රිතාන්‍යය පාලන ක්‍රමයක් පැවති අතර, එම කාල වකවානුවේ බ්‍රිතාන්‍ය කිරීටයට යටත් වීමත්, මිෂනාරි අධ්‍යාපනයේ ව්‍යාප්තියත්, කතෝලික දහම හා ගති සිරිත් වැළඳගත් ලාංකික පිරිසක් පැතිරීමත් විශේෂත්වය විය. අනගාරික ධර්මපාලතුමා සහ ජාතික ව්‍යාපාරය පිළිබඳ කරුණු දැක්වීමට පෙර කාල වකවානුවේ රටේ පැවති තත්ත්වය පිළිබඳ යම් අවබෝධයක් ලබාගැනීම අවශ්‍ය වේ. 1506 වර්ෂයේදී පෘතුගීසීන් පැමිණෙන තෙක්ම ලාංකිකයන් බෞද්ධ සංස්කෘතිය හා බැඳුණු අඛණ්ඩ සංස්කෘතියකට උරුමකම් කී අතරම ගොවිතැන හා බැඳුණු විවිධ ජන කොටස් හා විවිධ ආගම් අදහන්නන් සාමූහික වශයෙන් ජීවත්විය.

මෙහි ඇති විශේෂ වැදගත්කම නම් මීට පෙර ශ්‍රී ලංකාවට සංක්‍රමණය වූ පුද්ගලයින් සිංහල සංස්කෘතියට අනුව හැඩ ගැසීමයි.  නමුත් ප්‍රතිකාලුන් ඇතුළු යුරෝපීයන් ඊට වෙනස් ආකාරයෙන් ඔවුන්ගේ ආගම ව්‍යාප්ත කිරීමටත්, ශ්‍රී ලාංකික සංස්කෘතිය පහත් කොට සලකා කටයුතු කිරිමටත් පෙලඹුණි. ඔවුන් සිංහලයන් හඳුන්වන ලද්දේ නූගත් මිලේච්ඡ ජන කොටසක් ලෙසයි. එහිම අතුරු ඵලයක් ලෙස දොන් ජුවන් ධර්මපාල රජු 1558 දී ක්‍රිස්තියානි ධර්මය වැළඳගැනීම දැක්විය හැකිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ විහාර, දේවාල, නින්දගම් කතෝලික පල්ලිවලට පැවරීමත් සිදුවිණි. 1597 වර්ෂයේ දොන් ජුවන් ධර්මපාල රජු මිය යෑමත් සමඟ මෙරටේ අයිතිය තෑගි ඔප්පුවකින් පෘතුගාල රජුට පැවරිණි.

එතැන් පටන් බෞද්ධාගමට නිසි ආරක්ෂාවක් නොමැති වීමත්, බෞද්ධ වෙහෙර විහාර කඩා බිඳ දමා සම්පත් කොල්ලකෑමත් සිදුවිය. බොහෝ භික්ෂූන් වහන්සේලා මහණදම් අත්හල අතරම දැඩි හිත් සහිත ආගමට ලැදි පිරිස් ගණින්නාන්සේලා ලෙස ධර්මය ආරක්ෂා කිරීමට මුල්වීම විශේෂ සිදුවීමකි.

ඕලන්ද යුගයේදීත් අධිරාජ්‍යවාදී පාලනයට එරෙහි සටන් මතුවීම දක්නට ලැබිණි. 1704 වර්ෂයේදී මෙසේ ඇතිවන විරෝධතා විමර්ශනයට බතාවියෙන් කොමිසමක් පිහිට වූ අතර, කොමිසමේ වාර්තාවේ සඳහන් වූයේ ආගම ධර්මය ඇදහීමේ හා සිරිත්විරිත් පැවැත්වීමේ නිදහස ඉල්ලා මෙම යුගයේ සටන් ඇතිවූ බවය. ආගමික සහනය ඇති කිරීමට පිළියම් යෙදිය යුතු බව බතාවියේ නිර්දේශය වුවත් එය ක්‍රියාත්මක නොවීය.

මේ කාලය තුළ ගණින්නාන්සේලා පැරණි පතපොත් අධ්‍යයනය කිරීමත්, ඉගැන්වීමත් සිදුකරන ලදි. බතාවි කොමිසමෙන් පසුව ඔවුන්ට සුදු වස්ත්‍ර ඇඳීම වෙනුවට නැවතත් කසාවත හැඳීමට අවකාශයක් ලැබීම විශේෂ විය. එවැනි කහ සිවුරු අඳින ගණින්නාන්සේලා කණ්ඩායම් කිහිපයක්ම පහතරට ප්‍රදේශයේ වාසය කරන ලද බව පොත් පත් වල සදහන් වේ. මෙසේ බෞද්ධාගම ඇදහීමට ලැබුණ ඉඩ ප්‍රස්තාව මත දෙවන විමලධර්මසූරිය රජ යුගයේදී උපසම්පදාව රැගෙන ඒම සිදුවිය. පසුකාලීනව 1753 වර්ෂයේදී සියම් රටින් උපසම්පදාව ගෙන ඒමට වැලිවිට සරණංකර හිමියන් මුලික විය. මෙම භික්ෂු පිරිසට පහතරට භික්ෂු කණ්ඩායම් එකතු විමත් මෙහිදී සිදුවිය. කිර්ති ශ්‍රී රාජසිංහ රජු සමයේ සිල්වත් උගත් භික්ෂුන්ට පමණක් කුලගොත් විචාරීමෙන් යුතුව උපසම්පදාව ලබාදීමට ක්‍රියා කිරීමද දක්නට ලැබුණු විශේෂ ලක්ෂණයකි. පසුකාලීනව 1773 වර්ෂයේ තෙල්වත්ත උපසම්පදාවත්, 1797 වර්ෂයේ කැටන්තොට (තංගල්ල) උපසම්පදාවත් පවත්වනු ලැබිණි. 1803 වර්ෂයේදී බුරුමයෙන් උපසම්පදාව මෙරටට ගෙන්වා ගනිමින් බලපිටිමෝදර දී පහතරට විවිධ කුලවල භික්ෂූන් උපසම්පදා කිරිමත් සිදුවිය. අවුරුදු 20 ක් ඇතුළත අවස්ථා 05 දී උපසම්පදාවන් පැවැත්වීමෙන් භික්ෂූන් වහන්සේලාගේ අභිවෘද්ධියත්, සමාජයේ විශාල පරිවර්තනයක් වීම මෙකල සිදු වූ විශේෂ සිදුවීමකි. මේ වන විට ආරක්ෂා වී තිබූ ලාංකීය බෞද්ධ පොතපත නැවත විචාරීමත් සිදුවිණි. භාෂාන්තරවාදය හා අධිමාසවාදය වැනි වාද විවාද ඇතිවන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. එමඟින් පහතරට ප්‍රදේශවල බෞද්ධ අධ්‍යාපන ප්‍රබෝධය ඇතිවිමට කටයුතු සම්පාදනය විය.

1796 වර්ෂයේ බ්‍රිතාන්‍යයන් පැමිණි මුල් කාලවකවානුව වන විට බැප්ටිස්ට් සහ වෙස්ලියන්වාදී මිෂනාරීන් සමඟ වාදවිවාද ඇති වීම ඇරඹිනි. එහිදී හික්කඩුවේ සුමංගල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි හා බටුවන්තුඩාවේ හිමි මූලිකත්වය ගෙන කටයුතු කළ අතර, 1865 වර්ෂයේ බද්දේගමවාදය, 1865 වර්ෂයේ වරාගොඩවාදය, 1866 වර්ෂයේ උදම්මිටවාදය, 1873 වර්ෂයේ පානදුරාවාදය දක්වා එම වාදවිවාද ව්‍යාප්ත වුණි. ඒ හා සමගාමීව බෞද්ධ අධ්‍යාපන මධ්‍යස්ථාන ඇරඹීමේ අවශ්‍යතාවය ද සාකච්ජාවට බඳුන් විය. මිගෙට්ටුවත්තේ හිමි, ඇපා අප්පුහාමි වැනි අය පුණ්‍ය ආධාර එකතු කිරිමට මුලිකත්වය ගත් අතර, මෙම කටයුතු සඳහා ඩේවිඩ් හේවාවිතාරණ තරුණයාගේ පැමිණීම සිදුවන්නේ මේ වකවානුවේදී ය. ඔහු ඒ වන විට අවුරුදු 10 -12 තරුණයෙක් වූ අතර, පානදුරාවාදය ඔහුගේ මෙම ගමන් මඟට හේතු පාදක විය. පානදුරාවාදය පිළිබඳ ඇති වූ දැනහැඳිනීම් හා මිගෙට්ටුවත්තේ හිමියන්ගේ ආරාධනය පරිදි ඕල්කොට්තුමා ලංකාවට පැමිණීම බෞද්ධ ව්‍යාපාරයට සම්බන්ධ විය. එකල අලුතින් ස්ථාපිත වූ රාමඤ්ඤ නිකාය මඟින් අමරපුර හා සියම් නිකායික භික්ෂූන් විවේචනය කිරීමට සිදු විය. ඕල්කොට්තුමා ද රාමඤ්ඤ නිකායික භික්ෂූන් වෙත නැඹුරු වූ බවක් එහිදී දක්නට ලැබිණි. මේ අවධියේදී පරම විඥානාර්ථ සංගමයේ නැගීම සිදුවිය. පරම විඥානාර්ථ සමාගම ඇති වීමෙන් පසුව භික්ෂූන්ට වඩා

මුලිකත්වයක් හිමිවූයේ වෙළඳ පැලැන්තිය හා ඕල්කට්තුමා වෙත ය. ධර්මපාල තරුණයා ද ඔවුනට හිතවත් වූ අතර, 'සරසවි සඳරැස' පත්‍රයේ මුද්‍රණ කටයුතු ආදියටද සහය දැක්විය. 1883 වර්ෂයේදී කොටහේනේ දීපදුත්තාරාමයේ ඉදිකරන ලද බුදුපිළිම වහන්සේගේ නේත්‍ර ප්‍රතිෂ්ඨාපන උත්සවයේ පෙරහැරට සිදුකළ පහරදීම පිළිබඳව විශේෂයෙන් සඳහන් කළ යුතුය. කිතුනුවන්ගේ පාස්කු මංගල්‍යයත් බෞද්ධ පෙරහැරත් එක්ව යෙදීම මෙම ගැටුමට හේතු වූ ප්‍රධාන කරුණ විය. එකල මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ක්‍රිස්තියානි වත් පිළිවෙත් පිළිබඳ දැඩි විවේචන සහිත පුවත්පත් ලිපි පළ කරන ලදි. "කුරුසයේ රිලා කුණක් එල්වාගෙන වන්දනා කිරීම හොඳ"යැයි එක් වරක් පුවත්පතකට උන්වහන්සේ ප්‍රකාශ කර තිබුණි. මෙම පෙරහැරේදී ඒ අයුරින් රිලා කුණක් ගෙන යන බවට සාවද්‍ය ප්‍රචාරයක් පැතිරීම ප්‍රහාරයට හේතු වූවා යැයි එකල මතයක් පැවතිණි.

මෙම ගැටුමේ දී බෞද්ධයන්ට වූ අසාධාරණය පිළිබඳ මාලිගාකන්ද පිරිවෙනේදී රැස්වීමක් පැවැත්වූ අතර, එහිදී රැස්ව සිටි පිරිසේ තීරණය වුණේ බ්‍රිතාන්‍ය රජු වෙත පෙත්සමක් යැවීමට කටයුතු කළ යුතු බවයි. මෙම රැස්වීමට ඕල්කොට්තුමා සම්බන්ධ කරගත් බවත් ධර්මපාල තරුණයා සහ ඔහුගේ පියාණන් ද එයට සහභාගී වූ බවත්, අතීත තොරතුරුවල සඳහන් වේ. ධර්මපාල තරුණයා සාන්ත තොමස් විද්‍යාලයෙන් ඉවත් වූ පසු ආණ්ඩුවේ ලිපිකරුවෙකු ලෙස කලක් සේවය කරන ලදි. එහිදී ඔහුට ඕල්කොට්තුමාගේ පරිවර්තකයා ලෙසින් කටයුතු කිරීමට අවස්ථාව හිමි වූ අතර, ඉන් පසුව ධර්මපාලතුමා ජනතාවගේ අවධානයට ලක් විය. ඕල්කොට්තුමාගේ බෞද්ධ පාසල් ව්‍යාපාරයට සම්මාදම් පිණිස ගමින් ගමට ගොස් දේශනා පැවැත් වූ අතර, එහිදී භාෂා පරිවර්තකයා වූයේ ධර්මපාල තරුණයායි. නමුත් පසුකාලීනව ධර්මපාලතුමා සහ ඕල්කොට්තුමා අතර සිත් අමනාපකම් ඇති විය. සරසවි සඳරැස පත්‍රයේ ධර්මපාල තරුණයා රැකියාව කරන වකවානුවේ ඕල්කොට්තුමා වෙත තෑගි ලැබුණ දළදා වහන්සේගේ අනුරුවක් නුසුදුසු තැනක දමා තිබී හමුවීම එම මතභේදවලට හේතු වූ බව මතයක් පවතී. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් හා ඕල්කොට්තුමා අතර ද එවැනිම යම් මතභේද ඇතිවිය. එක් අවස්ථාවකදී මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඕල්කොට්තුමා රටපුරා සම්මාදන් කළ මුදල්, ගණන් හිලව් පිළිබඳ විමසා සිටි බවත්, ඊට උත්තර දීමට අපොහොසත් වූ ඕල්කොට්තුමා නැවත නැව් නැග ඇමෙරිකාව බලා ගිය බවත් සඳහන් වේ. ඕල්කොට්තුමාගේ නික්ම යාමෙන් පසුව ධර්මපාල තරුණයා සෘජුවම බෞද්ධ අධ්‍යාපනය නගා සිටුවීමට කටයුතු කරන ලදි.

1884 වර්ෂයේ ජනවාරි 27 වැනිදා කොටහේනේ දී සිදුවූ පහරදීම වැනි සිදුවීමක් නැවත ඇති නොවීමට බෞද්ධ ආරක්ෂක සභාවක් පිහිටවනු ලැබිණි. අනගාරික ධර්මපාලතුමා එහි ක්‍රියාකාරිකයෙකු ලෙස කටයුතු කරන ලදි. 1885 වර්ෂයේ දී ඔහු ධර්මපාල යන නාමය භාවිත කරන ලද අතර, අන්‍යාගමික නම් භාවිත නොකර සිංහල නම් භාවිත කිරීම බෞද්ධ

බලවේගයේම කොටසක් ලෙසින් හඳුන්වන ලදි. බෞද්ධයන් ආරිය සිංහල නම් ගැනීම ජාතික හැඟීම ඇති කිරීම උදෙසා වැදගත් බව එතුමාගේ අදහස විය.

1886 වර්ෂයේ සිට ධර්මපාලතුමන් රට පුරා දේශන පැවැත් වූ අතර, "The Buddhist" නම් සඟරාව ආරම්භ කිරීමට ද මූලිකත්වය ගෙන කටයුතු කරන ලදි. "සෝභන මාලිගාව" නමැති දෙමහල් රථයේ ගමින් ගමට ගොස් පැවැත් වූ දේශනා හේතුකොට ගෙන රටවැසියාගේ මානසික තත්ත්වය අවබෝධ කරගැනීමට ධර්මපාලතුමාට හැකිවිය. ගොවිතැනින් පමණක් ආර්ථිකය නගා සිටුවිය නොහැකි බව ඔහුගේ මතය විය. මිෂනාරි අධ්‍යාපනය හේතුවෙන් රටේ තරුණ පරම්පරාව දේශියත්වයෙන් ඈත් වී සිටින බවත්, විජාතික අනුකාරක මානසිකත්වයෙන් මිදුණු නිදහස් චින්තනය ඇති පුද්ගලයන් බවට පත්විය යුතු බවත් ඔහුගේ අදහස විය.

ජාතික නිදහස ලැබීමේ දී නිදහස් චින්තනයේ ඇති වැදගත්තම පෙන්වා දුන් එහිදී උදාහරණ කොට ගත්තේ දේශිය වී ගොවිතැනයි. ගොවිතැනේදී අන්‍යෝන්‍යය සහභාගීත්වය හා සහයෝගීතාවය තුළින් ගොඩනැගුණ අර්ථක්‍රමය මෙන් සාමූහිකව සිතීමේ හා ක්‍රියාකිරීමේ වැදගත්කම එතුමන් විසින් පෙන්වා දෙන ලදි.

1912 වර්ෂයේ ආණ්ඩුවේ ආදායම් වැඩිකර ගැනීමට සුරාබදු පනත ඇති කිරීමත්, ඊට විරුද්ධව ධර්මපාලතුමා විසින් අමද්‍යප ව්‍යාපාරය ආරම්භ කරනු ලැබීම විශේෂ කරුණක් විය. එමෙන්ම මිෂනාරි විරෝධී හා අධිරාජ්‍යය විරෝධී අදහස්, ජාතික පුනර්ජීවනය පිළිබඳ මතවාදයන් ගොඩ නැගීමට එතුමන්ට හැකි විණි. මානසික වශයෙන් ඇතිකරගත යුතු නිදහස පිළිබඳව එතුමා වඩාත් අවධානය යොමු කරන ලදි. යටත්විජිත පාලනය හා "මිෂනාරි අධ්‍යාපනය මඟින් නිවට නියාලු පිරිසක් ඇති කරන බවත්, එමඟින්, "සිතීමට අපොහොසත් ලියන අප්පුලා පිරිසක් බිහිකරන බවත්" එතුමාගේ අදහස විය. ඉන් මිදීමට නම් අධ්‍යාපන ක්‍රමය තුළ දේශපාලන දර්ශනය හා ඉතිහාසය ඉගැන්වීම, කාර්මික ආර්ථික අධ්‍යාපනය, ධනය නිෂ්පාදනය, නිෂ්පාදන හුවමාරුව හා පරිභෝජනය පිළිබඳ අවධානය යොමු කළ යුතු බව ද අවධාරණය කෙරිණි.

පිටරටින් භාණ්ඩ ආනනයනය කිරීමත්, ඒවා පරිභෝජනය කිරීමත් එතුමන් විවේචනාත්මකව පිටුදකින ලදි. එහිදී එතුමා ප්‍රකාශ කරන ලද්දේ "නිකමුන් ලෙස සිටින සෑම දෙනාම සකමුන් කළයුතු බවයි". නිකමුන් සකමුන් කිරීමට නම් කාර්මික පාසල් ඇති කළයුතු බව එතුමාගේ අදහස විය. පසුකාලීනව එතුමාගේ දේශනවලට වැඩි වශයෙන් සහභාගි වූයේ උගතුන් හා ධනවතුන් නොව කම්කරු ජනතාවයි.

1921 වර්ෂයේ සිට 1931 වර්ෂය දක්වා එතුමා ඉන්දු ලංකා බෞද්ධ කටයුතු වෙනුවෙන් කටයුතු කළ එතුමා 1931 වර්ෂයේ සිට ඉන්දියාවේ බෞද්ධ සිද්ධස්ථාන රැකගැනීම උදෙසා කාලය කැප කරන ලදී. ඉන්දියාවේදී "සිරි දේවමිත්ත ධර්මපාල" නමින් පැවිද්ද හා උපසම්පදාව ලබා ගත් එතුමා දැඩි ලෙස රෝගාතුරව 1933 වර්ෂයේ අප්‍රේල් මස 29 දා අපවත් විය.

ධර්මපාලතුමාගේ දර්ශනය තුළ ඉතිහාසයට වඩාත් වැදගත් තැනක් හිමි වේ. "ඉතිහාසය ඉගෙනීම වූ කලී ජාතික හැඟීම වර්ධනය කරගැනීමට අතිශයින්ම වැදගත් වන්නක් වශයෙන් මම සළකමි" යන්න එතුමාගේ ප්‍රකාශය විය. බුද්ධගයාව අන්‍යාගමිකයන්ගෙන් බේරා ගැනීමට විශාල මෙහෙවරක් කරමින් බුද්ධාගම ඉගැන්වීමට හා ප්‍රචාරය කිරීමට නම් ලාංකීය භික්ෂූන් වහන්සේලා විසින් හින්දි, උර්දු, බෙංගාලි වැනි ඉන්දියානු භාෂාවන් ඉගෙන ගතයුතු බව අවධාරණය කළ එතුමා භික්ෂූන්ට අධ්‍යාපන මධ්‍යස්ථාන ඇති කිරීමත්, අනෙකුත් ජනයාට කාර්මික පාසල් ඇති කිරීමත් කටයුතු කරන ලදී. රාජගිරියේ පිහිටවූ පේෂ කර්මාන්තශාලා, පිඟන් කර්මාන්තශාලා හා ගිනිපෙට්ටි කර්මාන්තශාලා එහි ප්‍රතිඵලයක් විය. විවිධ අවස්ථාවල ජපානයට කණ්ඩායම් යැවීමෙන් කාර්මික අධ්‍යාපනය ලබා ගැනීමට සැලැස්වීමත් එහි ඉදිරි පියවරයක් ලෙස දැක්විය හැකිය. කාර්මීකරණයත් සමඟ ජාතිවාත්සල්‍යයෙන් යුතු අධ්‍යාපනයක් ලබා දීම එහි අපේක්ෂාව විය. සමකාලීන බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ බලාපොරොත්තු සඵල කිරීමටත්, දිගු කාලයක් තිස්සේ ඉස්මතු වෙමින් පැවති ජාතික පුනර්ජීවන ව්‍යාපාරය නව දැක්මකින් යුතුව වේගවත් කිරීමටත් ධර්මපාලතුමාට හැකිවූ බවත් අවසාන වශයෙන් සඳහන් කළ යුතුය.